ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2022(2023 මාර්තු)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023 மார்ச்)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2022 (March 2023)

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
# வணிகக் கல்வியும் கணக்கீடும் I, II
# Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත් :** ❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්ණ 5කටපමණක් පිළිතුරු සපයන්න.

❖ ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.
❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

❖ පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (ii) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. බිනුවන් ජීවත්වන ප්‍රදේශයේ වැව ආසන්නයේ විශාල පන් යායක් ඇත. රජය විසින් පොලිතින් බෑග් තහනම් කිරීමේ නීතිය පැනවීමෙන් පසු **සුමුදු පන් බෑග්** නමින් අලංකාර නවීන පන්නයේ රටා සහිත පන් බෑග් නිපදවීමේ ව්‍යාපාරයක් 2022.01.01 දින බිනුවන් ඇරඹීය. මේ සඳහා ඔහු ඉතිරිකර ගත් රු. 200,000ක මුදල් ද, රු. 20,000ක් වටිනා උපකරණ ද යෙදුවේ ය. 2022.01.01 දින ම රු. 20,000ක් යොදා බැංකු ජංගම ගිණුමක් ඇරඹුවේ ය. පන් බෑග් නිෂ්පාදනයට සේවකයින් දෙදෙනෙකු බඳවා ගත්තේ ය. නියමිත පරිදි නිෂ්පාදන කටයුතු ඉටුවන්නේ දැයි සොයා බලා එසේ නොවන අවස්ථාවල දී එම කටයුතු වෙනස් කිරීමට බිනුවන් වග බලා ගත්තේ ය. 2022 ජනවාරි මස දරණ ලද වියදම් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| පන් ඉදිරිමට සහ ගෙනඒමට | රු. 20,000 |
| බෑග් සාදන සේවකයන්ට වැටුප් | රු. 30,000 |
| ඇසුරුම් සඳහා | රු. 2,000 |
| කම්හල් කුලී | රු. 13,000 |
| විදුලි වියදම් (චෙක්පතකින්) | රු. 3,000 |
| ජල බිල (චෙක්පතකින්) | රු. 2,000 |

❖ මාසය තුළ නිෂ්පාදනය කළ බෑග් ගණන 1,000කි. එක් බෑගයක් 20% ක ලාභයක් තබාගෙන, බෑග් සියල්ලම විකුණන ලදී. විකුණුම් වෙනුවෙන් සියලු ආදායම් ලැබුනේ චෙක්පත් මගිනි.

(i) අ. **සුමුදු පන් බෑග්** ව්‍යාපාරය අරමුණ අනුව හා අයිතිය අනුව කුමන ව්‍යාපාර වර්ගයන්ට අදාළ වේ දැයි වෙන වෙනම ලියන්න.

ආ. සංවිධාන ක්‍රමය අනුව කුමන ව්‍යාපාර වර්ගයකට අයත් වේ ද?

(ii) අ. මෙම ව්‍යාපාරය සම්බන්ධව ඇති ව්‍යාපාර අවස්ථාවක් ඉදිරිපත් කරන්න.

ආ. මෙම ව්‍යාපාරයේ නම ලියාපදිංචි කළ යුතු ද ? ඔබේ පිළිතුරුට හේතු ඉදිරිපත් කරන්න.

(iii) මෙම සිද්ධියේ සඳහන් ව්‍යාපාරයට ඇල්මැති පාර්ශවයන් දෙකක් නම් කරන්න.

(iv) අ. ඉහත සිද්ධියේ සඳහන් නිෂ්පාදන සාධක දෙකක් නම් කරන්න.

ආ. එම නිෂ්පාදන සාධක සඳහා නිදසුන බැගින් ඉදිරිපත් කරන්න.

(v) 2022.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව ලියා දක්වන්න.

(vi) මෙම ව්‍යාපාරය පවත්වාගෙන යා යුතු මූලික පොත් නම් කරන්න.

(vii) මෙම ව්‍යාපාරයේ මුළු නිෂ්පාදන වියදම කීය ද?

(viii) පන් බෑගයක විකුණුම් මිල කීය ද?

(ix) 2022-01-31 දිනට මුදල් ශේෂය කීය ද ?

(x) 2022-01-31 දිනට අයිතිකරුගේ හිමිකම කීය ද ? (ලකුණු 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

02. (i) අ. පුද්ගලයෙකු තම අවශ්‍යතා හා වුවමනා සපුරාගත හැකි ආකාර දෙකක් ලියන්න.

ආ. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් දෙකක් දක්වන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. භාණ්ඩ හා සේවාවල ගුණාත්වය ඉහළ නැංවීම ව්‍යාපාරයක උප අරමුණකි.

ආ. සිල්ලර හා තොග වෙළෙඳ ආයතන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකට නිදසුනකි.

ඉ. ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම හා එම තීරණ ක්‍රියාත්මක කිරීම කළමණාකරුවන්ගේ අරමුණකි.

ඊ. ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම්, වෙළෙඳ කලාප මගින් ජාත්‍යන්තර සබඳතා ඇති කර ගැනීම දේශපාලන පරිසරයට අයත් වේ.

(iii) ලහිරු සුදේශ් තම ගෙවත්තේ හා අසල්වැසි වතුපිටි වලින් සපයා ගන්නා ලද ශාක කඳන්, අතු මුල්, වැල් වලින් තම මිතුරෙකු වන දිල්ශාන් ගේ ද සහය ඇතිව, විවිධ විසිතුරු රූක් කලා නිර්මාණය කොට A-9 ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති කඩ කාමරයක තබා දෙස් විදේශ සංචාරකයින්ට අලෙවි කරයි.

අ. මෙම සිද්ධියේ සඳහන් නිෂ්පාදන සාධක දෙකක් ලියන්න.

ආ. ඔබ සඳහන් කල නිෂ්පාදන සාධක සඳහා උදාහරණය බැගින් ලියන්න.

(iv) චන්න ප්‍රධාන පාසල් කිහිපයක් ආසන්න ස්ථානයක පාසල් ලිපිද්‍රව්‍ය මුද්‍රිත පොත්පත් අලෙවිකිරීමේ වෙළෙඳ සැලක් පවත්වාගෙන යයි. දෛනිකව ලිපිද්‍රව්‍ය මිලට ගැනීමට එන පාසල් සිසුන් සංඛ්‍යාව වැඩිවෙමින් පවතී.

අ. චන්නගේ ව්‍යාපාරයට ඇති අවස්ථාවක් නම් කරන්න.

ආ. මොහුගේ ව්‍යාපාරයේ තිබිය හැකියැයි නිගමනය කලහැකි දුර්වලතාවයක් නම් කරන්න.

(ලකුණු 08 යි)

03. (i) ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී විවිධ නිර්ණායක යොදා ගනී. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. හවුල් ව්‍යාපාරවල හවුල් කරුවන් සංඛ්‍යාව තීරණය කරන්නේ 1890 හවුල් ආඥා පණතට අනුව ය.

ආ. රාජ්‍ය සංස්ථා, අයිතිය සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යාපාර සංවිධානයකි.

ඉ. ව්‍යාපාර සඳහා යොදවන කායිත හා මානසික දායකත්වය ශ්‍රමය වේ.

ඊ. ඇල්මැති පාර්ශවයක් ලෙස ප්‍රජාව, පරිසර හිතකාමී ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේදැයි විමසා බලයි.

(iii) ව්‍යාපාර සංවිධාන අරමුණ අනුව, අයිතිය අනුව හා පරිමාණය අනුව වර්ගීකරණය කෙරේ.

අ. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී භාවිත කරන ප්‍රමාණාත්මක නිර්ණායක 4ක් ලියන්න.

ආ. ඒක පුද්ගල හා හවුල් ව්‍යාපාර වල දැකිය හැකි පොදු ලක්ෂණ දෙකක් ලියන්න.

(iv) අ. රාජ්‍ය සංස්ථා ආරම්භ කෙරෙන ක්‍රම මොනවා ද ?

ආ. රාජ්‍ය සංස්ථා හඳුනාගත හැකි තවත් නම් 4ක් ලියන්න. (ලකුණු 08 යි)

## II **කොටස - ගිණුම්කරණය**

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

04. (i) අ. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක් ද ?

ආ. ලෙජරය යනු කුමක් ද ?

(ii) පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

අ. ව්‍යාපාරයේ පරිහරණයට රු. 100,000 උපකරණ "සයුර සමාගමෙන්" ණයට ගැනීම.

ආ. අයිතිකරුගේ පෞද්ගලික රක්ෂණ වාරිකය වූ රු. 10,000 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම.

(iii) අමල්ගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. 250,000 ක ප්‍රාග්ධනයක් යෙදවීම.
2. රු. 50,000ක බැංකු ණයක් ලබා ගැනීම.
3. අත්පිට ගැණුම් රු. 80,000 කි.
4. දුරකථන ගාස්තු ගෙව්වා රු. 7,500
5. රු. 60,000 ක භාණ්ඩ තොගයක් රු. 80,000කට විකිණීම.

පහත සඳහන් වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන අංක 01 ගනුදෙනුව උදාහරණයට ගෙන ඉතිරි ගනුදෙනු සමීකරණයට බලපාන අයුරු දක්වන්න.

| **ගනුදෙනු** | **වත්කම්** | | = | **හිමිකම්** + | **වගකීම්** |
|---|---|---|---|---|---|
| **අංකය** | **බඩුතොගය** | **ණයගැතියෝ** | **මුදල්** | **ප්‍රාග්ධනය** | **බැංකු ණය** |
| 01. | - | - | + 250,000 | + 250,000 | |
| 02. | | | | | |
| 03. | | | | | |
| 04. | | | | | |
| 05. | | | | | |

(iv) සරණිගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 3,000 කි. 2023 ජනවාරි මාසයේ සිදුවූ සුළු වියදම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2023.01.01 | ශේෂය ඉ/ගෙ | 400 |
| 2023.01.01 | අග්‍රිමය ලැබුණා | |
| 2023.01.03 | සංග්‍රහ වියදම් | 270 |
| 2023.01.07 | කඩදාසි ගත්තා | 350 |
| 2023.01.10 | පෑන් 10ක් ගත්තා | 200 |
| 2023.01.13 | ගෙනඒමේ කුලි | 450 |
| 2023.01.16 | සංග්‍රහ වියදම් | 250 |
| 2023.01.20 | ලිපිද්‍රව්‍ය වියදම් | 140 |
| 2023.01.24 | බස් ගාස්තු | 120 |
| 2023.01.28 | මුද්දර ගාස්තු | 150 |
| 2023.01.30 | මුදල් ගැනිලි | 400 |
| 2023.02.01 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා. | |

ලිපිද්‍රව්‍ය, ගමන්, තැපල් හා සංග්‍රහ විශ්ලේෂණ තීරු සහිතව ජනවාරි මාසයට අදාල සුළු මුදල් පොත පිළියල කරන්න.

(ලකුණු 12 යි)

05. (i) දෙව්මිගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයට අදාල ගනුදෙනු කීහිපයක් පහත දැක්වේ.

2023.01.01 බැංකු ශේෂය රු. 74,000

2023.01.03 ණයහිමියෙකු වූ පුබුදුට චෙක්පතකින් රු. 8,000 ගෙව්වා. ලද වට්ටම රු. 800

2023.01.08 ණයගැතියෙකු වූ පබෝධ රු. 6,000ක චෙක්පතක් ලබා දුන් අතර එය එදිනම බැංකු ගත කලා. දුන්වට්ටම රු. 300

2023.01.15 ගෙවල්කුලී රු. 4,000ක චෙක්පතකින් ගෙව්වා.

2023.01.16 ණයහිමියෙකු වූ සමන්ට රු. 5,000ක් චෙක්පතකින් ගෙව්වා.ලද වට්ටම රු. 500 යි.

**අවශ්‍ය වන්නේ,**

අ. ඉහත ගනුදෙනු බැංකු ගිණුමේ සටහන් කර තුලනය කරන්න.

ආ. දුන් වට්ටම් හා ලද වට්ටම් ගිණුම් සකස් කරන්න.

(ii) 2023 පෙබරවාරි මාසයේ ලක්සිරිගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 60,000 ක් විය. එහෙත් එදින ලද බැංකු ප්‍රකාශයේ ශේෂය රු. 73,000 ක් විය. වෙනසට හේතු පහත දැක්වේ.

01. බැංකුව විසින් අයකරගෙන ඇති බැංකු ගාස්තු රු. 2,000

02. බැංකුවට සෘජුවම ලැබී ඇති ප්‍රේෂණ රු. 12,000

03. තැන්පත් කළ මුත් නිෂ්කාෂණය නොවූ චෙක්පත් රු. 15,000

04. නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 18,000

**අවශ්‍ය වන්නේ,**

අ. බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

ආ. 2023 පෙබරවාරි 28 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙළ කරන්න.

(iii) අචිනිගේ නිමි ඇඳුම් අළෙවි ව්‍යාපාරයේ 2022 දෙසැම්බර් මාසයට අදාළ ණයට ගැණුම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංක | සැපයුම්කරු | ප්‍රමාණය | අනෙකුත් තොරතුරු |
|---|---|---|---|---|
| 2022-12-12 | 67 | පැහසරා | එකක් රු. 400 බැගින් ළමා ඇඳුම් 25 | වෙළෙඳ වට්ටම 8% |
| 2022-12-18 | 98 | පබසරා | එකක් රු. 300 බැගින් තොප්පි 40 | - |
| 2022-12-21 | 119 | වනසරා | එකක් රු. 275 බැගින් කලිසම් 20 | වෙළෙඳ වට්ටම 10% |
| 2022-12-24 | 125 | මල්සරා | එකක් රු. 410 බැගින් ළමා ඇඳුම් 20 | - |

**අවශ්‍ය වන්නේ,**

අචිනිගේ ව්‍යාපාරයේ 2022 දෙසැම්බර් මාසයේ ගැණුම් ජ'නලය.

(ලකුණු 12 යි)

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර

විසින් සම්පාදිත යි.